වගා සහනාධාර චක්‍රලේඛ අංක - 48

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474, කොළඹ.
1996.06.24 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකාරවරුන් හා
ස්ථානභාර නිලධාරීන් වෙත.

අලුතින් තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය
පස සාරවත් කිරීමේ අනිවාර්යය අවශ්‍යතාවයෙන්
<u>නිදහස් කළ හැකි ඉඩම් නිර්ණයනය කිරීම</u>

1996.03.11 දිනැති අංක සං/ව.ආ/ප්‍රති දරණ ලිපියට අතිරේකයකි.

පසුගිය ප්‍රාදේශීය කළමනාකාරවරුන්ගේ රැස්වීමේදී සාකච්ඡා කරන ලද පරිදි කුඩා තේ වතු හිමියන් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම්ද සලකා මෙහි පහත දක්වා ඇති ප්‍රදේශයන්හි පස සාරවත් කිරීමෙන් තොරව තේ වගා කිරීමට කරනු ලබන ඉල්ලීම් වලදී මතු සඳහන් පරිදි ක්‍රියා කරන මෙන් මෙයින් දැනුම් දෙමි.

(අ) <u>අදාල ප්‍රදේශ</u>

කළුතර දිස්ත්‍රික්කය
රත්නපුර, කෑගල්ල, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල නම් කරන ලද ප්‍රදේශ

(ආ) <u>අනුගමනය කළයුතු ක්‍රියාමාර්ගය</u>

1. ඉල්ලීම ඉදිරිපත් කරනු ලබන ඉඩම පිහිටි ප්‍රදේශය මේ සඳහා යෝග්‍ය ප්‍රදේශයක් බවට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාපෘති) විසින් නම් කර තිබිය යුතුය.

2. මේ සඳහා වූ ක්ෂේත්‍ර පරීක්ෂණය ප්‍රාදේශීය කළමනාකාර / ස්ථානභාර නිලධාරී සහ සහකාර ප්‍රාදේශීය කළමනාකාර (ව්‍යාපෘති) එකාබද්ධව කළයුතු වීම හා ඒ අනුව වාර්තා කිරීම.

3. පරීක්ෂා කළ යුතු කරුණු:

   I. පරීක්ෂණ අවස්ථාවේදී පස පැතිකඩ කිහිපයක් පරීක්ෂා කර පසේ අවම ගැඹුර සෙ.මී. 90 ට වැඩි බව තහවුරු කිරීම.

   II. පස් පැතිකඩ පරීක්ෂා කිරීමෙන් සෙ.මී. 90 ක් දක්වා ගැඹුරු ප්‍රදේශයේ පසේ ව්‍යුහය ( Soil Structure) සතුටුදායක බව සනාථ වීම.
   (බොරළු හෝ ගල් අවම තත්වයක විය යුතුය)

   III. මතුපිට සෙ.මී. 30 ක් දක්වා වූ ප්‍රදේශයේ ඉතා හොඳ කාබනික පස් තට්ටුවක් (සාමාන්‍යයෙන් 2% කට අධික) තිබීම.

IV. ඉඩමේ කිසිම කොටසක් හෝ සෝදා පාළුවට ලක්ව නොතිබීම.

V. දැනට ස්ථිර භෝගයක් නොමැති අවු: 5 - 10 පමණ කාලයක් ලදු කැලෑ බවට පත්වූ ඉඩම්.

VI. ඉඩම පරීක්ෂණ අවස්ථාවේදී එම පැල සිටුවා නොතිබිය යුතු අතර, ඉහත සඳහන් කරුණු පැහැදිලිව නිරීක්ෂණය කළහැකි තත්වයේ තිබිය යුතුය.

මූලික පරීක්ෂණයේදී ඉහත කරුණු පිළිබඳව නිරීක්ෂණ සලකා බලා නිර්දේශ කළහැකි තත්වයේ වූ ඉඩම් පිළිබඳ වාර්තා ප්‍රාදේශීය කළමනාකරු / ප්‍රධානකාර නිලධාරීගේ නිර්දේශ සහිතව මා වෙත ඉදිරිපත් කළයුතු අතර, මාගේ අනුමැතිය මත පමණක් නියමිත ක්‍රියාවන්ට පටන් මේ සඳහා අවසරය ලබාදීමට කටයුතු කළහැකි බව සැලකිය යුතුය.

මෙම චක්‍රලේඛයේ (අ) දිස්ත්‍රික්ක සඳහා පමණක් වන ආධාර චක්‍රලේඛ 44 (ආ) II ඡේදය අනුව සංශෝධනය විය යුතුය.

මෙම චක්‍රලේඛය ලැබූ බවත්, ඒ අනුව ක්‍රියා කරන බවත් නොපමාවම දන්වා එවන්න.

(සරත් ඉලංගසිංහ)
සභාපති.

පිටපත් :-

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වාණිජ)
2. අභ්‍යන්තර විගණන
3. මුදල් කළමනාකරු
4. සහකාර සාමාන්‍යාධිකාරී (පරිපාලන)

Cir/48